දුර්ලභ

# සංස්කෘත කෝෂ සාහිත්‍යය
## (ආරම්භය සහ වර්ධනය)

විද්‍යාලංකාර විශ්වවිද්‍යාලයේ

ශාස්ත්‍රපති

උපාධිය සඳහා නියමිත පරිදි ඉදිරිපත් කරන

නිබන්ධයයි

11

ජිනසෝම විරසූරිය

විසිනි

1968

## විෂය සංක්ෂේපය

නිබන්ධය පරිච්ඡේද හයකින් සමන්විත වේ.

වේදය ආශ්‍රිත ව ඇති වූ අර්ථ ව්‍යාඛ්‍යාන සම්ප්‍රදාය මුල් කොට භාරතීය කෝෂ සම්ප්‍රදාය ආරම්භ වූ අයුරුත්, ශබ්ද සංග්‍රහ කිරීමට පූර්ව වූ මූලික අවස්ථාවක් වශයෙන් වේදයේ පදපාඨගත පද විභාගයන්ගේ වැදගත්කමත් පළමු වැනි පරිච්ඡේදයෙන් විමසා තිබේ.

සංස්කෘතයේ මුල් ම ශබ්ද සංග්‍රහ වූ නිඝණ්ඩු, නිරුක්ති සම්ප්‍රදාය ඇසුරෙන් සම්පාදනය වූ ආකාරයත්, නිඝණ්ඩුපදවල අර්ථ කථනයෙහි ලා යාස්ක උපයෝගී කර ගෙන ඇති ක්‍රමයත්, අර්ථ කථනය සඳහා වේද ප්‍රාමාණ්‍යයෙන් බැහැර ව වඩා ශාස්ත්‍රීය ක්‍රමයක් තහවුරු කර ගැනීමට ඔහු දරා ඇති වෑයමත් දෙවැනි පරිච්ඡේදයෙන් පරීක්ෂා කෙරේ.

භාෂාව පිළිබඳ ශාස්ත්‍රීය විමර්ශන වඩාත් ලෞකික පක්ෂයට නැඹුරු වූ ආකාරය තුන් වැනි පරිච්ඡේදයෙන් විභාග කෙරේ. භාෂා විෂය වඩා පුළුල් ව වැඩීම හා එයට බල පෑ කරුණුත් පාණිනීය ව්‍යාකරණයේ පසුබිම වශයෙන් සලකා විමසා බලා තිබේ. එක් අතකින් ව්‍යාකරණ රූප වශයෙන් අෂ්ටාධ්‍යායීයෙන් ඉදිරිපත් කොට ඇති කෝෂයේ පෘථුලත්වය හා එය සාහිත්‍යකරුවන් කෙරෙහි බල පා ඇති අන්දම විමසා ඇති අතර, අනික් අතින් කෝෂ ක්‍රමය ව්‍යාකරණමය ප්‍රයෝජනයක් සඳහා භාවිත කොට ඇති අන්දම ගණ පාඨය, ධාතු පාඨය හා උණාදි කෝෂය ඇසුරෙන් දක්වා තිබේ.

කලක සිට ම වර්ධනය වෙමින් පැවති ලෞකික ශාස්ත්‍රයන්ගෙන් පරිපෝෂිත ව ලෞකික සංස්කෘතයේ මුල් ම කෝෂ කෘතිය වූ අමර කෝෂය සම්පාදනය වූ අයුරු සිවු වැනි පරිච්ඡේදයෙන් විමර්ශනයට ලක් කෙරේ. එම කෝෂයේ වස්තු විෂය ගැන අවබෝධයක් ඇති කරනු සඳහා එහි ශබ්ද සංග්‍රහ ක්‍රමය හා එයට අන්තර්ගත වර්ග ද සවිස්තර ව විග්‍රහ කොට තිබේ.

පස් වැනි පරිච්ඡේදය සංස්කෘතයේ සමස්ත කෝෂ පරම්පරාව පිළිබඳ සමාලෝචනයකි. ව්‍යාකරණය පිළිබඳ අවශ්‍යතා අනුව අමරසිංහගේ මාර්ග දේශකත්වය යටතේ සංස්කෘත කෝෂ සාහිත්‍යය දේශීය කෝෂකරුවන් අතින් පෝෂණය වූ අයුරුත් යම් යම් නවාංග එයට එකතු වූ අයුරුත්, සාහිත්‍යය හැර වෙනත් විෂයයන්ට ද කෝෂ ක්‍රමය අදාළ කර ගනු ලැබූ පරිදිත් මෙහි විමසිල්ලට භාජන කොට තිබේ. සංස්කෘත කෝෂකරණයේ අරමුණ පලකා කෝෂ සාහිත්‍යයේ අගය ප්‍රමාණ කිරීමට ද මෙහි උත්සාහයක් දරා තිබේ.

පෙරදිගට පැමිණි යුරෝපියයන් සංස්කෘතය හැදෑරීම නිසා සංස්කෘත කෝෂකරණය නව මඟකට යොමු වූ අයුරුත්, සංස්කෘත භාෂා-ධ්‍යයනය ව්‍යාප්ත වීම නිසා කෝෂ සම්පාදනය කිරීමේ අරමුණ වඩා පුළුල් වූයෙන් නවීන කෝෂ ශාස්ත්‍රීය මූලධර්මයනට අනුගත ව වඩා විද්‍යාත්මක ලක්ෂණයෙන් යුත් කෝෂ දේශීය හා විදේශීය කෝෂකරුවන් අතින් සකස් වූ අන්දමත්, සංස්කෘත කෝෂකරණයෙහි ලා මේ දක්වා කර ඇති කටයුතුත් සවැනි වූ අවසාන පරිච්ඡේදයෙන් විමර්ශනයට භාජන කොට තිබේ.